# ශ්‍රී ලංකාවේ පාසල් කෘෂිකර්ම අධ්‍යාපනය

මෑතකදී ආරම්භ වූ කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත හා වාණිජ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුව අනුව පෙනෙන්නේ කුඩා, මධ්‍යම මහා පරිමාණ වාණිජ කෘෂි ව්‍යවසායක ක්ෂේත්‍රයන් බිහිවීම ඵලදායී බවය. මේ අනුව වර්තමාන සමාජ - ආර්ථික සංවර්ධනයට ගැලපෙන අයුරින් ශ්‍රමිකයන් බිහි කිරීමේදී කෘෂි අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉටු කළ හැකි මෙහෙවර අසීමිතය.

පැරණි යැපුම් කෘෂිකර්මය නගා සිටුවීමටත් නව වාණිජ කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීමටත් යෝග්‍ය අයුරින් කෘෂි අධ්‍යාපනය සකස් විය යුතුය. ග්‍රාමීය ප්‍රදේශවලින් නගරයට ඇදී එන උගත් තරුණ ශ්‍රමය ග්‍රාමීය සංවර්ධනයටම නැඹුරු වන ආකාරයෙන් කෘෂි අධ්‍යාපන පද්ධතිය සංවිධානය කළ යුතුය. ඒ අනුව ගතානුගතිකත්වයෙන් මිදුණු, තාක්ෂණ කුසලතාවන්ගෙන් නිපුණ, කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ උසස් ආකල්ප ගොඩනගා ගත් අනාගත පරපුරක් බිහි කිරීම අත්‍යාවශ්‍යය.

ජාතික අධ්‍යාපන ආයතනයේ
කෘෂිකර්ම අධ්‍යන අංශයේ
සහකාර ව්‍යාපෘති නිලධාරී (කෘෂිකර්ම)
එන්.ඒ. ගුණවර්ධන විසිනි

## වර්තමාන තත්ත්වය

ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ පළමු වසරේ සිට 6 වසර දක්වා කෘෂිකර්මයට අදාළ විෂයයන් නොමැත. 7 හා 8 වසර ද සෘජුව කෘෂිකර්මය ලෙස හැඳින්වූයේ නැතත්, කෘෂිකර්මයට අයත් ඉගෙනුම් සිද්ධි කිහිපයක් ජීවන කුසලතා නමින් ඇතුළත් වී ඇත. අනතුරුව 9 වසරේදී කණිෂ්ඨ තාක්ෂණික පාඨමාලා නමින් කෘෂිකර්මයට අයත් පාඨමාලා 20ක් ඉදිරිපත් කෙරේ. කෘෂිකර්මය යන නමින් කෘෂිකර්මයට අයත් පාඨමාලා 20ක් ඉදිරිපත් කෙරේ. සැබැවින්ම කෘෂිකර්මය යන විෂය ක්‍රමවත්ව ඉගැන්වෙන්නේ 10,11 වසරවලදී සහ 12,13 වසරවලදී ය.

10,11 වසරවලදී කෘෂිකර්ම විෂය ක්ෂේත්‍රයට අයත් විෂයයන් 06කි. එනම්,

1. කෘෂිකර්මය
2. සත්ත්ව පාලනය
3. උද්‍යාන විද්‍යාව
4. ආහාර විද්‍යාව හා තාක්ෂණය
5. ගොඩතර ජලාශ ජීව සම්පත් තාක්ෂණය
6. සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය.

මෙයින් එක් විෂයක් අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ශිෂ්‍යයින්ට හැදෑරිය හැකි අතර ඒ යටතේ ලිඛිත විභාගයකට මෙන්ම ප්‍රායෝගික පරීක්ෂණයකටද ඔවුන් මුහුණ දිය යුතුය.

12,13 වසර සඳහා කෘෂි විද්‍යාව විෂයය හදාරණ ශිෂ්‍යයින්ට විද්‍යා විෂයයන් සමඟ කෘෂි විද්‍යාව හැදෑරුවේ නම් විද්‍යා හෝ කෘෂි විද්‍යා පීඨයන්ට ද, කලා විෂයයන් සමඟ කෘෂි විද්‍යාව හැදෑරුවේ නම් කලා හෝ වාණිජ පීඨයන්ට ද ඇතුළත්වීමට සුදුසුකම් ලැබිය හැකිය.

## වැදගත්කම හා අවශ්‍යතාව

1995 සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් 20.3%ක් කෘෂිකර්ම අංශයෙන් ලැබුන අතර කෘෂිකර්ම අංශයේ ශ්‍රම දායකත්වය මුළු ශ්‍රම බලකායෙන් 35%ක් පමණ විය. මේ අනුව තවමත් කෘෂිකර්ම ක්ෂේත්‍රය අපේ රටේ ආර්ථිකයේ සැළකිය යුතු වැදගත් අංශයක් සේ සැළකේ.

තාක්ෂණිකව දියුණුව අද දක්වා පැවත ආ කෘෂි - ආර්ථික සංවර්ධන රටාවම දේශීය වශයෙන් තවදුරටත් පැලපදියම්වී තිබීම හා ඊට අනුරූපව

ඉහත කරුණු සලකා බලා අනාගත කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා සේවා සැපයිය හැකි සහ අනාගත රැකියා වෙළඳපොළට අවතීර්ණවීම සඳහා අවශ්‍ය දැනුම සහිත ආර්ථික ඵලදායී පුද්ගලයින් බිහි කිරීමේ අරමුණින් අ.පො.ස.(උ.පෙළ) සඳහා දැනට ඇති කලා, විද්‍යා හා වාණිජ විෂය ධාරාවන්වලට අමතරව තාක්ෂණ විෂය ධාරාවක් යෝජනා කෙරේ.

ගොවියා තවදුරටත් කටයුතු කිරීම නිසා කෘෂි - ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දේශීය ගොවියාගෙන් ලැබිය යුතු දායකත්වය නිසි ලෙස නොලැබේ. ආර්ථික වශයෙන් ඵලදායී නොවූ කෘෂිකර්ම රටාවෙන් තරුණ පරපුර ඉවත්ව යාමත්, ඒ අනුව කෘෂිකර්මයට ශ්‍රම දායකත්වය ලබා ගැනීමේ අපහසුවත් ක්‍රමයෙන් වර්ධනය වනු පෙනේ.

මෑතකදී ආරම්භ වූ කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත හා වාණිජ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුව අනුව පෙනෙන්නේ කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වාණිජ කෘෂි ව්‍යවසායක ක්ෂේත්‍රයන් බිහිවීම ඵලදායී බවය. මේ අනුව වර්තමාන සමාජ - ආර්ථික සංවර්ධනයට ගැලපෙන අයුරින් ශ්‍රමිකයන් බිහි කිරීමේදී කෘෂි අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉටු කළ හැකි මෙහෙවර අසීමිත ය.

පැරණි යැපුම් කෘෂිකර්මය නගා සිටුවීමටත් නව වාණිජ කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීමටත් යෝග්‍ය අයුරින් කෘෂි අධ්‍යාපනය සකස් විය යුතුය. ග්‍රාමීය ප්‍රදේශවලින් නගරයට ඇදී එන උගත් තරුණ ශ්‍රමය ග්‍රාමීය සංවර්ධනයටම නැඹුරු වන ආකාරයෙන් කෘෂි අධ්‍යාපන පද්ධතිය සංවිධානය කළ යුතුය. ඒ අනුව ගතානුගතිකත්වයෙන් මිදුණු, තාක්ෂණ කුසලතාවන්ගෙන් නිපුන, කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ උසස් ආකල්ප ගොඩනගා ගත් ආනාගත පරපුරක් බිහි කිරීම අත්‍යාවශ්‍යය.

## වසර 2000 සඳහා යෝජනා

ඉහත කරුණු සලකා බලා අනාගත කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා සේවා සැපයිය හැකි සහ අනාගත රැකියා වෙළඳපොළට අවතීර්ණවීම සඳහා අවශ්‍ය දැනුම සහිත ආර්ථික ඵලදායී පුද්ගලයින් බිහි කිරීමේ අරමුණින් අ.පො.ස.(උ.පෙළ) සඳහා දැනට ඇති කලා, විද්‍යා හා වාණිජ විෂය ධාරාවන්වලට අමතරව තාක්ෂණ විෂය ධාරාවක් යෝජනා කෙරේ. මෙම තාක්ෂණ විෂය ධාරාව යටතේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් විෂයයන් 10ක් පමණ දැනට හඳුනා ගෙන ඇත.

1. සත්ත්ව සම්පත් තාක්ෂණය
2. කෘෂි තාක්ෂණ වේදය
3. ව්‍යවහාරික කෘෂි උද්භිද විද්‍යාව
4. කෘෂි ආර්ථික විද්‍යාව හා කෘෂි ව්‍යාපාර සංඛ්‍යානය
5. ආහාර විද්‍යාව හා තාක්ෂණය
6. ජාන සම්පත්
7. කෘෂි පරිසර හා වන විද්‍යාව
8. සමුද්‍රීය තාක්ෂණය
9. කෘෂි සම්පත් කළමනාකරණය
10. කෘෂි විද්‍යාව 11

මෙම විෂයයන්ගෙන් තුනක් උසස් පෙළ විෂයයන් ලෙස තෝරාගත් ශිෂ්‍යයෙකුට තාක්ෂණ උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා යොමු විය හැකිය. නොඑසේ නම් ස්වයං රැකියාවකට හෝ වඩාත් ඵලදායී කෘෂි ව්‍යවසායකයෙකු වීමට හැකිය.

මේ අයුරින් විෂය නිර්දේශ කිහිපයක් සකස් කිරීම තුළින් ශිෂ්‍යයින්ගේ රුචිකත්වයට හා ප්‍රදේශයේ සම්පත්වලට අනුව ඔහුට ගැලපෙන කෘෂි තාක්ෂණ විෂයයන් තෝරා ගත හැකි වනු ඇත. ඒ මඟින් අද ලෝකයට ඔබින, කෘෂි තාක්ෂණ කුසලතාවන්ගෙන් නිපුන ඵලදායී පුරවැසියෙකු බිහිකර ගැනීම අපේක්ෂා කෙරේ.